**හලාවත ප්‍රාදේශීය සභාව**

**පුත්තලම දිස්ත්‍රික්කය**

-----------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 ජූලි 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට හලාවත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේ ආයෝජන පොලී ගිණුම් ගත කර ඇතත් වැරදීමකින් ජ'නල් සටහන් මඟින් 2014 වර්ෂයේ ආයෝජන පොලී ඉවත් කිරීමෙන් ආයෝජන ගිණුම සහ සමුච්චිත අරමුදල් ගිණුම රු.228,322 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) රු. 634,050 ක් වූ යන්ත්‍රෝපකරණ දෙකක් ගිණුම්වලින් ඉවත් කර තිබීම නිසා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුම හා යන්ත්‍රෝපකරණ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) වටිනාකම රු.252,850 ක් වූ උපකරණ ජ'නල් සටහනක් මඟින් ගිණුම්වලින් ඉවත් කර තිබුණු අතර, නැවත එය තවත් ජ'නල් සටහනක් මඟින් රු.224,150 ක් ලෙස ගිණුම් වලින් ඉවත් කර තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 08 කට අදාල පාලන ගිණුම් අනුව වූ ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන අනුව වූ ශේෂයන් අතර, රු. 15,318,820 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයට අදාල ස්ථිර වැටුප් ප්‍රතිපූර්ණ වෙනුවෙන් පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් රු.5,776,723 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

(ආ) 2015 වර්ෂයට අදාල කර්මාන්ත 03ක් වෙනුවෙන් පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් රු.551,227 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

(ඇ) 2012 වර්ෂයට පෙර සහ 2013, 2014 සහ 2015 වර්ෂවල සිට අය නොවී තිබූ සේවක ණය රු.352,077 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2014 වර්ෂයේ සිට ගිණුම්වල දක්වා තිබෙන රු.4,763,700 ක් වූ ණයහිමි ශේෂ 50ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

උපලේඛන, කාල විශ්ලේෂණ, සමීක්ෂණ මණ්ඩල වාර්තා හා අදාල විස්තර විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.146,934,195 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකිවිය.

**1.3.5 නිතී,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම්**

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | |
| (i) අංක 59 රීතිය | සෑම වර්ෂයක් ආරම්භයේදීම සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයන් පවත්වා කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. |
| (ii) අංක 218 රීතිය | සභාවේ සියලු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය කර නොතිබුණි. |
| (ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | කාක්කපල්ලිය උප කාර්යාලයට අයත් කඩකාමර 10 ක් සහ තැපැල් කාර්යාලය පිහිටි කාමරය වෙනුවෙන් අයකර තිබූ කුලිය 2000 වර්ෂයෙන් පසුව සංශෝධනය කර නොතිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | සභාව සතු පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් චක්‍රලේඛයේ සඳහන් පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණි. |

**1.3.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

සමාලෝචිත වර්ෂයේදී ජ'නල් සටහන් පහක් මඟින් ගිණුම් හා ලේඛන අනුව ශේෂයන් සමාන කිරීම සඳහා හිඟ හිටි ආදායම් රු.1,096,335 ක් විධිමත් අනුමැතියකින් තොරව සමුච්චිත අරමුදලට හර කර තිබුණි.

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.50,149,812 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.48,250,727 ක් විය.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

මූල්‍ය ප්‍රතිඵලය රු.1,899,085 කින් වර්ධනයවීම සඳහා ආදායම් විෂයයන් හතරක් රු.7,211,263 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**2.3 ආදායම් පරිපාලනය**

**2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

සමාලෝචිත වර්ෂය අවසානයට රැස්කල යුතු වරිපනම් හා බදු ආදායමෙන් සියයට 32 ක් , අක්කර බදු ආදායමෙන් සියයට 75 ක් සහ බදු කුලී ආදායමෙන් සියයට 11 ක් අයවී නොතිබුණි.

**2.3.2 බදුකුලී**

**පහත කරුණු නිරීක්ෂණය විය.**

(අ) සමාලෝචිත වර්ෂයේදී සභාව සතු බදු දේපල 34 ක් බදු දී නොතිබුණු අතර, අවම ලංසු වටිනාකම පදනම් කර ගෙන අහිමි වූ ආදායම රු.892,216 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මස් කඩ කුලී රු.488,434 ක් හිඟව පැවති අතර, ඉන් රු.416,397 ක් 2011 වර්ෂය හා ඊට පෙර වර්ෂවලට අදාලව අය විය යුතු බදු කුලී විය.

**2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන ලේකම්වරයාගෙන් අයවිය යුතු උසාවි දඩ මුදල රු.33,851,207 ක් වූ අතර, ඉන් රු.16,671,661 ක මුදලක් වර්ෂ 2009 – 2015 කාල සීමාවට අදාල විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රධාන ලේකම්වරයාගෙන් අයවිය යුතු මුද්දර ගාස්තු මුදල රු.86,592,284 ක් වූ අතර, ඉන් රු.57,592,284 ක මුදලක් 2014 හා 2015 වර්ෂවලට අදාල විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

2016 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ඇස්තමේන්තුගත වටිනාකම රු.5,950,000 ක් වූ කර්මාන්ත 31 ක් සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කට්ටිකර විකුණා තිබුණු ඉඩම්වලින් පොදු පහසුකම් සඳහා වෙන්කර තිබුණු එකතුව රූඩ් 07 පර්චස් 21.43 ක් වූ ඉඩම් කොටස් 05 කට අදාල ඔප්පු සභාව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේදී අයකරගෙන තිබූ එකතුව රු. 648,968 ක්වූ දඩ මුදල් ගොඩනැගිලි සංවර්ධන අරමුදල නමින් ඉතිරි කිරීමේ ගිණුමකට බැර කර තිබුණි. මෙම මුදල වැඩි ප්‍රතිලාභයක් ලැබෙන ආයෝජනයක යෙදවීම පිළිබඳ සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

2016 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාවට අනුව ද්විතීයික සහ ප්‍රාථමික ශ්‍රේණි දෙකෙහි එකතු අතිරික්තය 10 ක් විය.

**04. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

**4.1 අයවැය පාලනය**

අයවැයගත වියදම ඉක්මවා සියයට 225 කින් ප්‍රාග්ධන වියදම් ඉහල ගොස් තිබුණු අතර, වරිපනම් බදු, කුලී ආදායම්, වෙනත් ආදායම් පිළිවෙලින් සියයට 12.4 ක්, සියයට 19.2 ක් සහ සියයට 13.7 කින් අඩු වී තිබුණි.

**4.2 අභ්‍යන්තර විගණනය**

2016 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්මේ සඳහන් විගණන කාර්යයන් සිදු කර අවසන් කර නොතිබුණු අතර, වර්ෂය තුල වාර්තා 08 ක් පමණක් නිකුත් කර තිබුණි.

**05. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ණයහිමියෝ | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වර්ෂ 2 කාලයක් ඉකුත්වී තිබෙන ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) | ආදායම් රැස්කිරීම | විවිධ මාර්ගවලින් සභාවට ලැබිය යුතු ආදායම් එකතු කර ගැනීමට කටයුතු කර නොතිබීම සහ බදු දිය හැකි දේපල 34 ක් බදු දීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) | සේවක ණය | හිඟහිට පවතින සේවක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |